**2022 පෙබරවාරි මස 18 වන දින පැවැති ආගමික,සංස්කෘතික,ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව**

**කමිටු සාමාජිකයන්**

1. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. දුමින්දු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. ඩබ්.ජී.සී.කේ.ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නොපැමිනිම**

1. දුමිඳු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
2. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. ඩබ්.ජී.සී.කේ.ප්‍රභාත් කිර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නිලධාරි**

1. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
2. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
3. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
4. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
5. ජී.වී.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
6. එරික් ප්‍රසන්න මදනායක මහතා - ජ්‍යොෂ්ඨ වැඩ අධිකාරි
7. එම්.ජී.සී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
8. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
9. රංජිත් හෙට්ටිආරච්චි මහතා - ක්‍රීඩා නිලධාරි
10. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි
11. අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක
12. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නිලධාරි නොපැමිණිම**

1. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
2. ජී.වී.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
3. එරික් පි මදනායක මහතා - ජ්‍යොෂ්ඨ වැඩ අධිකාරි
4. එම්.ජී.සී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
5. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි
6. අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක

1. අනුරාධපුර,3 වන පියවර,මහනාම උයන 3 පටුමග,ප්‍රදේශවාසීන් විසින් ලිපියක් යොමු කරමින් ඔවුන්ගේ නිවාස ඉදිරිපිට ඇති කුඩා පිට්ටනියේ විශාල ලෙස තණ කොළ හා වෙනත් ශාඛ වැවී ඇති බැවින් කුඩා දරුවන්හට ක්‍රීඩා කිරිමට හැකි වෙන පරිදි සුද්ධ පවිත්‍ර කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.
දැනට ක්‍රීඩා පිටි සුද්ධ පවිත්‍ර කිරිමේ කාර්ය සිදුවෙමින් පවතින බව දැනුම් දීමට තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

2. අනුරාධපුර,3 වන පියවර,කාශ්‍යප මාවත,අංක:2661,අනුරාධපුර දිස්ත්‍රික් ජනතා අයිතීන් ආරක්ෂක පෙරමුණ,සභාපති හා වැඩ බලන ලේකම් බන්දුල ගුණතිලක මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 3 වන පියවර අංක:2486 දරණ ළමා ක්‍රිඩා පිටිය මීන් පෙර පවුල් 07 ක් පමණ බලෙන් පදිංචිවී ඇති බව සඳහන් කර ඇත. දැනට ඉතිරිව පවතින පර්චස් 60 ක පමණ බිම් ප්‍රමාණය විවිධ කණ්ඩායම් විසින් අල්ලා ගැනීමට සුදානම් වෙන බැවින් මෙම ක්‍රීඩා පිටිය ආක්‍රමණිකයන්ගෙන් බේරා ගන්නා ලෙස කර ඇති ඉල්ලීම.
මෙම ක්‍රීඩා පිටිය සුද්ධ පවිත්‍ර කිරිමටත්, එහි මහා නගර සභාවේ පුවරුවක් යෙදිමටත් තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

3. අනුරාධපුර, පොදු වෙළඳසැල් පෙදෙස, පන්සල පාර, ශ්‍රී සුගතාරාමය,විහාරාධිපති පූජ්‍ය ඇස්වත්තේ සුමනසිරි හිමි විසින් ලිපියක් ඉදිරිපත් කරමින් බුදු මැදුරෙහි වහළය ඉදිකරවා දෙන ලෙසත්, බුදු පිළිමය, දැගසවු පිළිම සහ චිත්‍රවල සායම් ආලේප කිරිම ද සිදු කර දෙන මෙන් කර ඇති ඉල්ලීම.
කොට්ඨාශ මන්ත්‍රීතුමිය සමග සාකච්ජා කර තීරණයක් ගැනිමට තීරණය විය.

4. ගරු නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 571 නුවර වැව තුලාන අභිමංසල පාර පිහිටා ඇති සඳහම් ක්‍රීඩා සමාජයට අයත් වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කර දෙන ලෙසත්, ඒ සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දෙන ලෙසත් කර ඇති ඉල්ලීම.
මෙම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිමට සහ ක්‍රීඩා උපකරණ ලබාදිමට තිරණය විය.

5. අනුරාධපුර,2 වන පියවර,යුනයිටඩ් ක්‍රීඩා මහාජය (බි කණ්ඩායම),සභාපති, එල්.එස්.වි.පතිරණ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් යුනයිටඩ් ක්‍රීඩා පිටිය ක්‍රීඩාවට සුදුසු ලෙස සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.
මෙම ක්‍රීඩා පිටිය සුද්ධ පවිත්‍ර කරදීමටත් එහි කසළ නොදමන ලෙස පුවරුවක් යෙදිමට තීරණය විය. (වගකීම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි / නාගරික ඉංජිනේරු)

6. ශ්‍රී ලංකා සකල කලා සංසදය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් සකල කලා කරුවන්ගේ සුබ සාධන පුනා්‍ය අරමුදලට බැතිබර අනුග්‍රාහක දායකත්වය ලබා ගැනිම සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
නගර සීමාවේ නොවන බැවින් සලකා බැලිමට තීරණය විය.

7. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා විසින් ලිපියක් යොමු කරමින් පණ්ඩුකාභයපුර හරිත උද්‍යානයේ මුරකුටියක් සකස් කර දෙන ලෙසත්, එම උද්‍යානයට වතුර මල් 06 ක් ලබා දෙන ලෙසත් කර ඇති ඉල්ලීම.
ඇස්තමේන්තුවක් සකස් කර ඊළඟ මුදල් ස්ථාවර කමිටුව වෙත යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

8. 2022 වර්ෂයේ ආගමික,සංස්කෘතික,ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්ෂික සැළැස්ම කමිටුව විසින් අනුමත කරන ලදි. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

9. "මහා නගර සභා වෙසක් කළාපය - 2022" පොලිස් වටරවුමේ සිට අලුත් බස්නැවතුම්පල දක්වා වෙසක් කූඩු තරඟාවලියක් පැවැත්විම සහ නගර සභාව ඉදිරිපිට බැති ගී පැවැත්විමට කල යෝජනාව.
මෙම යෝජනාව කමිටුව විසින් අනුමත කරන ලදි. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

10. අනුරාධපුර මහා නගර සභාව මගින් පොදු කටයුත්තක් සඳහා කොඩි කණු ගැසීමේදී ඒ සඳහා අයදුම් පත්‍රයක් සකස් කිරිමට කල යෝජනාව.
සපයන සේවාව සඳහා අයදුම් පත්‍රයක් සකස් කර ලබාදිමට තීරණය කරන ලදි.

11. බක් මහ උළෙලක් පැවැත්විමට කල යෝජනාව. 2022 අප්‍රේල් මස 02 වන දින මහජන ක්‍රීඩාංගනයේ පැවැත්විමට තීරණය කරන ලදි. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

12. ගරු නාගරික මන්ත්‍රී නදිර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා විසින් තිසාවැව පොදු සුසාන භූමියේ මතක බන වැඩසටහනක් පැවැත්විමට කල යෝජනාව.
එම යෝජනාවට තිසාවැව පොදු සුසාන භූමියේ මතක බන වැඩසටහනක් පැවැත්විමට තීරණය කරන ලදි. (වගකිම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

**මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා**

- ගරු නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 571 නුවර වැව තුලාන පිහිටුවා ඇති "සඳහම් ඇස" ළමා සමාජයේ දරු දැරියන්ගේ සහභාගීත්වයෙන් වෙසක් පෝය නිමිති කර ගෙන දින දෙකක් භක්ති ගී ප්‍රසංගයක් පැවැත්වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම. මේ සඳහා රු.150,000.00 ක දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.

| | |
|---|---|
| ආගමික වතාවක් සඳහා පිරිකර | රු. 5,000.00 |
| සංගීත උපකරණ සහිත කණ්ඩායම | රු. 45,000.00 |
| ශබ්ධවාහිනි උපකරණ | රු. 15,000.00 |
| අව්වැසි ආවරණ සැපයීම | රු. 30,000.00 |
| ආසන සපයා ගැනිම | රු. 20,000.00 |
| සංග්‍රහ වියදම් | රු. 25,000.00 |
| සහභාගීත්ව සහතිකයන් ලබාදීම | රු. 10,000.00 |
| | රු.150,000.00 |

- අනුරාධපුර,රජරට සංඥා සෙවනැලි විශ්‍රාමික සංගමය,සභාපති විසින් ලිපියක් ඉදිරිපත් කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ යුධ හමුදා සංඥා බලකායට අයත් විශ්‍රාමික අයවළුන් ඒකරාශි කර පිහිටුවා ගෙන ඇති මෙම සංගමය විසින් පවත්වනු ලබන "නගරාධිපති කුසලාන සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය" සඳහා පහත සඳහන් ලෙස අනුග්‍රහයක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

| | |
|---|---|
| ශූරතාවය සඳහා ත්‍යාගය | රු.100,000.00 |
| අනු ශූරතාවය සඳහා ත්‍යාගය | රු. 50,000.00 |
| අනෙකුත් වියදම් සඳහා | රු. 50,000.00 |

- ගරු නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 571 නුවර වැව ප්‍රදේශයේ වෙසෙන ජනතාව වෙනුවෙන් සෑම මසකම ධර්ම දේශනාවක් පැවැත්වීමට එහි ආරම්භක දේශනයේ වියදම් පියවා ගැනිම සඳහා පහත සඳහන් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරමින් අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

| | |
|---|---|
| අට පිරිකර 01 | රු. 7,500.00 |
| මුතුකුඩ 01 | රු. 5,000.00 |
| කිරි ආහාර ප්‍රජා කිරිමේ භාජන කට්ටල 01 | රු. 3,500.00 |
| ධර්ම ආසනය සහ ධර්ම මණ්ඩපය සැකසිම | රු. 7,500.00 |
| පිරිස සඳහා අසුන් පැනවීම සහ අව්වැසි ආවරණ සැපයීම | රු.20,000.00 |
| සංග්‍රහ කටයුතු සඳහා | රු.12.500.00 |
| | රු.56,000.00 |

- ගරු නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් 571 නුවර වැව සහ 572 හේනවත්ත තුලානය ආවරණය වන පරිදි අංක 03 හේනවත්ත කොට්ඨාශයේ 2022 වර්ෂයේ බක්මහ උළෙල සඳහා වියදම් පියවා ගැනිමට රු.150,000.00 ක ආධාර මුදලක් (571 නුවර වැව වෙහෙර මහ දෙව් ප්‍රජා මණ්ඩලය සතු ගිණුමට ) ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

- අනුරාධපුර,ජයන්ති මාවත,252 තුලාන 2 පියවර,විහාර මහාදේවි කාන්තා සමිතිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 2022 මාර්තු මස 30 වන දින ජයන්ති මාවත කඩ 30 ක්‍රීඩා පිටියේ පැවැත්වෙන අවුරුදු උළෙල සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.(අපේක්ෂිත වියදම රු.50,000.00 කි)

  කොට්ඨාශ නාගරික මන්ත්‍රීවරයාගේ ප්‍රතිපාදන මත ගෙවීම් කිරිමට කමිටු නිර්දේශය අනුමැතියට යොමු කිරිම.

- කොට්ඨාශ 15 තුල සක්‍රිය ක්‍රීඩා සමාජ සඳහා පමණක් ක්‍රීඩා භාණ්ඩ බෙදාදීමට එක් කොට්ඨාශයකට රු.15,000.00 ක මුදලක් වෙන් කිරිමටත්, කොට්ඨාශයේ ක්‍රීඩා තරඟාවලිය සඳහා රු.35,000.00 ක මුදලක් ගෙවිම සඳහා අනුමැතියට ඉදිරිපත් කිරිම. එම තරඟාවලියේදී භාණ්ඩ බෙදාදීමටත්, අධික්ෂණය සහ මෙහෙයවීම් කටයුතු මහා නගර සභා ක්‍රීඩා නිලධාරි මගින් සිදු කිරිමට තීරණය කරන ලදි.

- ආගමික කටයුතු යටතේ කොට්ඨාශය තුල ආගමික කටයුත්තක් සිදු කිරිම සඳහා එක් කොට්ඨාශයකට රු.25,000.00 බැගින් කොට්ඨාශ 15 සඳහා මුදලක් ලබාදීමට කමිටුව ගත් තීරණය අනුමැතියට යොමු කිරිම.

ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා,
නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,
ආගමික,සංස්කෘතික,ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,
මහා නගර සභාව,
අනුරාධපුර.